# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2454/54 - 2025 සැප්තැම්බර් මස 18 වැනි බ්‍රහස්පතින්දා - 2025.09.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය**

පස්වන සංශෝධනය

පහත I කොටසෙහි සඳහන් පරිදි සංශෝධිත 2014 ඔක්තෝබර් 22 දිනැති හා අංක 1885/31 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය පහත II කොටසෙහි දැක්වෙන ආකාරයට නැවත සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

**ඩබ්ලිව්. එච්. එම්. එම්. සී. කේ. දයාරත්න,**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2025 සැප්තැම්බර් මස 16 වැනි දින.

**I කොටස**

සංශෝධන අංක 01 - 2017 පෙබරවාරි 02 දිනැති හා අංක 2004/59 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 02 - 2018 ජුනි 19 දිනැති හා අංක 2076/14 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 02 - 2018 ජුලි 11 දිනැති හා අංක 2079/39 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 03 - 2020 දෙසැම්බර් 30 දිනැති හා අංක 2208/18 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 04 - 2021 නොවැම්බර් 26 දිනැති හා අංක 2255/55 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*

**II කොටස**

02 ඡේදයේ සිට 05 ඡේදය දක්වා සෑම ස්ථානයකම ඇති පන්තිය යන වචනය සඳහා ශ්‍රේණිය යන වචනය ආදේශ කිරීම.

06. සේවයට අයත් තනතුරු :

6.2 ඒකාබද්ධ තනතුරු සංඛ්‍යා වගුව පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.-

| ශ්‍රේණිය | සංඛ්‍යාව |
|---|---|
| I ශ්‍රේණිය | 3532 |
| II/ III ශ්‍රේණි | 12980 |

7. බඳවා ගැනීමේ ක්‍රමය 7.2 යටතේ දක්වා ඇති 7.2.1 වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය: ශ්‍රී ලංකා විදුල්පති සේවයේ III ශ්‍රේණිය

7.2.4. බඳවාගැනීමේ ක්‍රමය

7.2.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය

"ලිඛිත පරීක්ෂණයට ලැබූ මුළු ලකුණු සංඛ්‍යාව පදනම්ව ඉහළම ලකුණු ලැබූ අනුපිළිවෙළ අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එයින් සුදුසුකම් ලබන්නන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ." යන්න ඉවත් කරනු ලැබේ.

දැනට පවතින "සටහන" ඉවත් කර පහත සටහන ඇතුළත් කරන්න.

සටහන:

I. අයදුම්කරුවකුට තම මනාපය පරිදි පුරප්පාඩු පවතින දිස්ත්‍රික්ක 03ක් සඳහා අයදුම් කිරීමට අවස්ථාව ලබා දෙනු ලබන අතර අයදුම්පත් කැඳවනු ලබන නිවේදනයේ එක් එක් මාධ්‍ය අනුව පුරප්පාඩු පවතින දිස්ත්‍රික්කයන් ප්‍රසිද්ධ කරනු ලැබේ.

II. එක් එක් දිස්ත්‍රික්කයේ සිංහල සහ දෙමළ මාධ්‍ය අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට පෙර ප්‍රසිද්ධ කරනු ලැබේ.

III. ලිඛිත පරීක්ෂණයේ දී ලබාගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව එක් එක් දිස්ත්‍රික්කය සඳහා මනාපය පළකර ඇති අයදුම්කරුවන්ගෙන් එම දිස්ත්‍රික්කයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයකට නොඅඩු සංඛ්‍යාවක් සිංහළ සහ දෙමළ මාධ්‍ය අනුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. (යම් දිස්ත්‍රික්කයක පවතින පුරප්පාඩු සංඛ්‍යාව දහය (10) කට අඩුවන අවස්ථාවේ දී අයදුම්කරුවන් 20කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවනු ලැබේ.)

IV. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී මූලික සුදුසුකම් පමණක් පරීක්ෂා කරනු ලබන අතර, එම සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගි වන සියලුම අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට සහභාගි කරවනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට සහභාගිවීම මූලික සුදුසුකම් සම්පූර්ණ කර ඇති බව සැලකීම සඳහා හිමිකමක් ලෙස සලකනු නොලැබේ.

V. ලිඛිත පරීක්ෂණයේ දී සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගන්නා ලකුණුවල එකතුව අනුව එක් එක් දිස්ත්‍රික්කය සඳහා සකස් කරනු ලබන කුසලතා අනුපිළිවෙළ මත නිලධරීන් බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ. එක් දිස්ත්‍රික්කයකට වඩා වැඩි දිස්ත්‍රික්ක සංඛ්‍යාවකට සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් අයදුම්පත්‍රයේ දක්වා ඇති මනාප අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ. කිසිදු අයදුම්කරුවකට අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති මනාප අනුපිළිවෙල කිසිදු කරුණක් මත පසුව වෙනස් කිරීමට අවස්ථාව ලබා දෙනු නොලැබේ.

VI. ඉහත සඳහන් පරිදි යම් දිස්ත්‍රික්කයක් සඳහා බඳවා ගන්නා ලද නිලධාරියකු එම දිස්ත්‍රික්කයෙන් පිටතට ස්ථාන මාරුවීම සඳහා අවම වශයෙන් දිස්ත්‍රික්කයේ වසර පහ (05)ක කාලයක් සේවය කළ යුතුය.

VII. යම් දිස්ත්‍රික්කයක මුළු පුරප්පාඩු සංඛ්‍යාව සඳහා නිලධාරින් බඳවා ගැනීමට නොහැකි වන අවස්ථාවක දී ඉතිරි පුරප්පාඩු ප්‍රමාණය සඳහා නැවත සාමාන්‍ය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ ඉහත සඳහන් පරිදි පැවැත්වීමට කටයුතු කරනු ලැබේ.

VIII. යම් දිස්ත්‍රික්කයක පවතින පුරප්පාඩු සංඛ්‍යාව සඳහා ලිඛිත පරීක්ෂණය සමත් ප්‍රමාණවත් නිලධාරින් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවක දී එම ඉතිරි පුරප්පාඩු ප්‍රමාණය සඳහා පිළිවෙලින් එම දිස්ත්‍රික්කය අයත් පළාතේ සහ සමස්ත ලංකා මට්ටමින් පවතින කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

08. කාර්යක්ෂමතා කඩඉම:

8.1 වගුව පහත පරිදි සංශෝධනය කරනු ලැබේ:

| *කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග* | *කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද* | *කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලා/ වෙනත්* |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියට බඳවාගෙන වසර තුනක් (03) ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය “ආ” පරිශිෂ්ටය |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ II ශ්‍රේණියට උසස් වී වසර තුනක් (03) ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය “ඇ” පරිශිෂ්ටය |

09. භාෂා ප්‍රවීණතාව යටතේ දක්වා ඇති සන්ධාන භාෂා ප්‍රවීණතාවය ලබා ගැනීම පිළිබඳ 9.1, 9.2 හා 9.3 හි සඳහන් විධිවිධාන ඉවත් කරනු ලැබේ.

10. ශ්‍රේණි උසස්කිරීම:

10.1.1 (ii) වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

(ii) උසස් කිරීම් සඳහා සුදුසුකම් ලබන දිනට සේවයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර හය (06) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු අතර, වැටුප් වර්ධක හය (06)ක් උපයාගෙන තිබිය යුතුය.

10.1.2 පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

10.1.2 උසස් කිරීමේ ක්‍රමය:

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරින් විසින් පත්කිරීමේ බලධාරියා වෙත නියමිත ආකෘති පත්‍රයෙන් ඉල්ලුම් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත්වීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ. ඉල්ලුම් කළ යුතු ආකෘති පත්‍රය “ඈ” පරිශිෂ්ටයේ ඇත.

10.2.1 (i) පහත පරිදි සංශෝධනය කරනු ලැබේ

10.2.1 සපුරාලිය යුතු අවශ්‍යතා :

(i) උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට සේවයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර හය (06) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු අතර, වැටුප් වර්ධක හය (06) ක් උපයාගෙන තිබිය යුතුය.

10.2.2 පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

10.2.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරින් විසින් පත් කිරීමේ බලධාරියා වෙත ඉල්ලුම් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම පත් වීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ. ඉල්ලුම් කළ යුතු ආකෘති පත්‍රය “ඉ” පරිශිෂ්ටයේ ඇත.

11. තනතුරුවලට පත් කිරීම

වගුවෙහි 1 පන්තියේ සහ 2 හා 3 පන්තිවල යන්න I ශ්‍රේණියේ සහ II හා III ශ්‍රේණියේ ලෙස සංශෝධනය කරනු ලැබේ.

13. නිපුණතා සංවර්ධනය

13.2. ධාරිතා සංවර්ධනය යටතේ 13.2.1 හා 13.2.2 පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

13.2.1 ධාරිතා සංවර්ධන පුහුණු පාඨමාලාව 1:

සෑම නිලධාරියෙක්ම විදුහල්පති සේවයට පත් වී වසර හය (06) ක් තුළ රේඛීය අමාත්‍යාංශයේ අධ්‍යාපන ලේකම් විසින් බලය පවරන ලද ආයතනයක් මගින් පවත්වනු ලබන මාස 01 ක ධාරිතා සංවර්ධන පුහුණු පාඨමාලාව 1 සාර්ථකව සම්පූර්ණ කළ යුතු ය.

13.2.2 ධාරිතා සංවර්ධන පුහුණු පාඨමාලාව 2:

සෑම නිලධාරියෙක්ම විදුහල්පති සේවයේ II ශ්‍රේණියට උසස්වී වසර හය (06) ක් තුළ රේඛීය අමාත්‍යාංශයේ අධ්‍යාපන ලේකම් විසින් බලය පවරන ලද ආයතනයක් මගින් පවත්වනු ලබන මාස 01 ක ධාරිතා සංවර්ධන පුහුණු පාඨමාලාව 2 සාර්ථකව සම්පූර්ණ කළ යුතු ය.

17. අන්තර්ග්‍රහණය කිරීමේ පටිපාටිය

17.4 අන්තර්ග්‍රහණය කිරීමේ පටිපාටිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

17.4 අන්තර්ග්‍රහණය කිරීමේ පටිපාටිය:

17.4.1 මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 වන පන්තියේ සියළුම නිලධාරින් සේවයේ III වන ශ්‍රේණියට ද,

17.4.2 මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 වන පන්තියේ II ශ්‍රේණියේ සියළුම නිලධාරින් සේවයේ II ශ්‍රේණියට ද,

17.4.3 මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 වන පන්තියේ I ශ්‍රේණියේ සිටින පෙර සේවා ව්‍යවස්ථාවට අනුව 2008.07.01 දිනට ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 පන්තියට උසස්වීමට සුදුසුකම් සපුරා ඇති නිලධාරින් සේවයේ I ශ්‍රේණියට ද, අනෙකුත් 2 පන්තියේ I ශ්‍රේණියේ සියළුම නිලධාරින් සේවයේ II ශ්‍රේණියට ද,

17.4.4 මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 වන පන්තියේ සියළුම නිලධාරීන් සේවයේ I ශ්‍රේණියට ද, අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

“අ” පරිශිෂ්ටයේ 03(අ) පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

03(අ) මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.

“ආ” පරිශිෂ්ටයේ පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

"ආ" පරිශිෂ්ටය

**ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණිය සඳහාවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

01. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත වේ.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| 1. ආයතන සංග්‍රහයේ විධිවිධාන හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති | පැය 02 | 100 | 40 |
| 2. පාසල්වල මුදල් පරිපාලනය හා මුදල් රෙගුලාසි | පැය 02 | 100 | 40 |
| 3. සන්ධාන භාෂාව (ඉංග්‍රීසි) | පැය 03 | 100 | 40 |

02. නිලධාරියෙකුට නියමිත විෂයයන් සඳහා එකම වතාවක දී හෝ වෙන වෙනම අවස්ථා කිහිපයක දී හෝ පෙනී සිටිය හැක.

03. සාමාර්ථය සඳහා සෑම ප්‍රශ්න පත්‍රයකට ම අවම වශයෙන් 40% ක් ලකුණු ලබා ගත යුතු ය.

04. විෂය නිර්දේශය:

(i) ආයතන සංග්‍රහයේ විධිවිධාන හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති - කාලය පැය 02යි.

ආයතන සංග්‍රහයේ පරිච්ඡේද VII, VIII, IX, X, XI, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII, XLVIII යන පරිච්ඡේද හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති පිළිබඳ දැනුම පරීක්ෂා කරනු ලැබේ.

(ii) පාසල්වල මුදල් පරිපාලනය හා මුදල් රෙගුලාසි - කාලය පැය 02යි.

අයවැය ඇස්තමේන්තු මුදල් පාලනය හා මූල්‍ය වගකීම් පැවරීම, මුදල් භාර ගැනීම ගිණුම් ගත කිරීම හා ප්‍රතිග්‍රහණය, ගෙවීම්, රාජ්‍ය මුදල් භාරකත්වය, අග්‍රිම හා බැංකු ගිණුම්, වැඩ හා සේවා, භාණ්ඩ සමීක්ෂණ, විගණන විමසුම්, රජයේ කාර්යාලවල භාවිතා වන ලෙජර්, ආදායම් හා වියදම් සාරාංශ, බැංකු සැසඳුම්, නොගෙවූ චෙතන, රාජකාරි දුරකථන පිළිබඳව නිකුත් කර ඇති චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි පිළිබඳ සාමාන්‍ය අවබෝධය පරීක්ෂා කෙරේ.

(iii) සන්ධාන භාෂාව (ඉංග්‍රීසි) - කාලය පැය 03 යි.

විෂය නිර්දේශය

Suitable level of proficiency on the following forms of grammar in the written language is expected from the candidate :-

- Tenses and Numbers
- Sentences (Simple/ Compound/ Complex/ Compound Complex)
- Relative Clauses
- Reported Speech
- Adjectives and Adverbs
- Determiners
- Prepositions

The knowledge on the modern formats and styles of writing is tested in following area of study:-

- Summary writing
- Report writing
- Essay writing

**සටහන:** රාජ්‍ය සේවා කොමිසන් සභා චක්‍රලේඛ 08/2020 අනුව 2020.07.01 දින සිට පහත සුදුසුකම් සහිත නිලධාරීන් සන්ධාන භාෂාව සමත් වීමේ අවශ්‍යතාව සම්පූර්ණ කළ නිලධාරීන් ලෙස සලකනු ලබයි.

අ. ඉංග්‍රීසි මාධ්‍යයෙන් උපාධිය / පශ්චාත් උපාධිය සම්පූර්ණ කරන ලද නිලධාරීන්;

ආ. අ.පො.ස. (උ/පෙ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයය (අතිරේක විෂයයක් නොවන පරිදි) සමත්ව ඇති නිලධාරීන්;

ඇ. අ.පො.ස. (සා/පෙ) විභාගයේදී ඉංග්‍රීසි විෂයය සඳහා (අතිරේක විෂයයක් නොවන පරිදි) සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහල සාමාර්ථයක් ලබා ඇති නිලධාරීන්;

ඈ. සේවයට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාගයට ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් පෙනී සිටින නිලධාරීන්.

05. (අ) මෙම විභාගයේ 01 හා 02 ප්‍රශ්න පත්‍ර සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පැවැත්වෙන අතර 03 ප්‍රශ්න පත්‍රය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.

(ආ) අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් පමණක් මෙම විභාගයේ 01 හා 02 ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුතු අතර මෙම විභාගයේ 03 ප්‍රශ්න පත්‍රය සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පෙනී සිටිය යුතු ය.

"ඇ" පරිශිෂ්ටයේ මාතෘකාව හා 01 පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

**"ඇ" පරිශිෂ්ටය**

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ II ශ්‍රේණිය සඳහාවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

01. සේවයේ II ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පහත සඳහන්වන විෂයයන්ගෙන් සමන්විත වේ.

"ඈ" පරිශිෂ්ටය ඉවත් කරනු ලැබේ.

දැනට පවතින "ඉ" පරිශිෂ්ටය "ඈ" ලෙස ද, "ඊ" පරිශිෂ්ටය "ඉ" ලෙස ද සංශෝධනය කරනු ලැබේ.

EOG 09-0187

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.